---

**විසර්ජන ශීර්ෂය - 266**

---

**වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012**

---

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

---

i. රජයේ කටයුතු හා නීතියෙන් පැවරුණු කාර්යයන්හි කාර්ය සාධනය නිලධාරීන් හා සංවිධාන මගින් ගම් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධීකරණය

ii. වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

iii. ආදායම රැස්කිරීම

iv. මුල්‍ය කළමනාකරණය හා වෙන්කරන ලද අරමුදල් ගිණුම්කරණය

v. විමධ්‍යගත අයවැය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

vi. විවිධ විදේශාධාර අරමුදල් ව්‍යාපෘති අධීක්ෂණය හා අපේක්ෂිත සංවර්ධන ප්‍රතිපත්ති සඳහා යොමු කිරීම.

vii. පළාත් සභාවේ කටයුතු වලට සහයවීම.

viii. යහපත් සම්බන්ධතාවය පවත්වාගෙන යාමෙන් දිස්ත්‍රික්කයේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ක්‍රියාකාරකම් විධිමත්ව සම්බන්ධීකරණය කිරීම.

ix. මහජනතාව වෙත කාර්යක්ෂමව සේවාවන් ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරීන් විධිමත්ව අධීක්ෂණය කිරීම.

x. රජයේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ යථා තත්ත්වය ඇති කිරීමට සහය වීම.

xi. නිසි වේලාවට සේවාවන් තහවුරු කිරීම සඳහා පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.

1.2 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

---

(අ) වවුනියා දකුණ දෙමළ

(ආ) වවුනියා දකුණ සිංහල

(ඇ) වවුනියා උතුර

(ඈ) වෙන්ගල චෙඩ්ඩිකුලම්

## 1.3 විගණන විෂය පථය

වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන , පොතපත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වු විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වු කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුලි 11 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට හා අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවු ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුල්‍ය වාර්තා හා පොත් අනුව, විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙම වාර්තාවේ (අ) සිට (ඊ) දක්වා වු පොදු නිරීක්ෂණ සහ 1.6 සිට 1.12 දක්වා වු ඡේද වල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ වලින් ඇතිවන බලපෑම හැර වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| **ශීර්ෂය / විෂය අංකය** | **ගිණුමේ නම** | **ගිණුම් ඉදිරිපත් කරන ලද දිනය** |
|---|---|---|
| 266 | විසර්ජන ගිණුම | 2013. මාර්තු 27 |
| 266001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය | 2013.පෙබරවාරි 28 |

**(ආ) පොත් හා ලේඛන නොපැවැත්වීම**

(i). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක , උපාංග හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002 / 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

(ii). බිල්පත්, අනුමැතීන්, ප්‍රසම්පාදන ලියකියවිලි ආදී අවශ්‍ය සාක්ෂි නොමැතිවීම නිසා රු. 1,203,176 ක් වු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගනුදෙනු 22 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(iii). වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු. 345,707 ක් වූ පුනරාවර්තන වියදම්, අවස්ථා 11 කදී සාවද්‍ය ලෙස වර්ගීකරණය කර විවිධ මූලධන වැය විෂයයන් යටතේ ගිණුම්ගතකර තිබුණි.

(iv). වවනියා උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු. 89,530 ක් වූ පුනරාවර්තන වියදම් අවස්ථා 03 ක් දී සාවද්‍ය ලෙස වර්ගීකරණය කර විවිධ වැය විෂයයන් යටතේ ගිණුම්ගතකර තිබුණි.

(ඇ) **විසර්ජන ගිණුම**

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.167,339,888 ක් වු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.163,216,474 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ඉතිරි කිරීම් රු.4,123,414 ක් එනම් 2.46 ක ප්‍රතිශතයක් විය. විස්තර පහත දැක්වේ.

| **වියදම්** | **2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය** | **2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය** | **2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය** | **2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය** | **2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 119,500,000 | 131,339,888 | 130,590,286 | 74,602 | 0.57 |
| මූලධන | 36,000,000 | 36,000,000 | 32,626,188 | 3,373,812 | 9.3 |
| එකතුව | 155,500,000 | 167,339,888 | 163,216,474 | 4,123,414 | 2.46 |

(ii) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පිළිවෙලින් රු. මිලියන 144 කින් සහ රු. මිලියන 572 කින් සමන්විත එකතුව රු. මිලියන 716 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර එයින් පිළිවෙලින් රු. මිලියන 130 කින් සහ රු. මිලියන 554 කින් සමන්විත රු. මිලියන 684 ක මුදලක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 32 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

---

(iii) රාජ්‍ය වියදම් කළමනාකරණය

-----------------------------------

අංක 155 හා 2011 දෙසැම්බර් 30 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ලබා දුන් පුනරාවර්තන සහ මූලධන වැය වලින් පිළිවෙලින් සියයට 02 ක හා සියයට 09 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතුව තිබූ නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුනරාවර්තන වියදමින් සියයට 0.57 ක් පමණක් ඉතිරි කර තිබුණි.

(iv) ඉන්ධන සහ විදුලි වියදම් කළමනාකරණය

-------------------------------------------------

අංක 156 හා 2012 පෙබරවාරි 16 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි, ඉන්ධන හා විදුලි වියදම් සඳහා අයවැය ලේඛනය මගින් කරන ලද ප්‍රතිපාදන සීමාව තුල වියදම් කළමනාකරණය කළ යුතුය. භාණ්ඩාගාරයෙන් අමතර මුදල් ලබා නොගත යුතු අතර මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීමටද භාණ්ඩාගාරය විසින් අනුමැතිය දෙනු නොලැබේ. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී මු.රෙ. 66 යටතේ රු. 850,000 ක ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

------------------------------------------------------------

පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබූ සීමා

----------------------------------------------

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්, විෂය අංක 26601 යටතේ පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබූ සීමා හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 10,000,000 | 8,291,166 | 7,000,000 | 7,988,254 | 40,000,000 | 32,843,124 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දිනට වූ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයට අනුව, 2012 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවති ශේෂ එකතුව රු.1,261,490 ක් වූ අතර එම හිඟ ශේෂයන් අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවන පරිදි රු. 99,000 ක් වූ ණය දෙකක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබා දී තිබුණි.

(iii) හර ශේෂ සම්බන්ධයෙන් වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යලය විසින් පවත්වා තිබූ පොත්පත් හා භාණ්ඩාගාර පරිසනක මුද්‍රිත සටහන් අතර රු. 34,800 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ඉ) අග්‍රිම ගිණුම්**

-------------

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අග්‍රිම ගිණුමේ හර හා බැර ශේෂය පිළිවෙලින් රු. 1,243,742,665 ක් සහ රු. 1,243,742,217 ක් වූ අතර රු. 448 ක වෙනස නිරවුල් කර තිබුණේ 2013 ජනවාරි 15 දින දීය.

**(ඊ) පොදු තැන්පත් ගිණුම**

-----------------------

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.63,817,283 වූ අතර විස්තර පහත දැක්වේ.

| **ගිණුම් අංකය** | **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6003/0/0/42/0 | 63,817,283 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්ම වූ රු.2,337,816 ක තැන්පතු ශේෂ 40 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 565(5) අනුව ඊළඟ මාසය අවසන්වීමට පෙර පොදු 71 ආකෘතියේ තැන්පතු පිළිබඳ මාසික සාරාංශ ප්‍රකාශයක් විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද මුදල් රෙගුලාසි විධිවිධාන වලට පටහැනිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් විසින් 2012 වර්ෂය සඳහා තැන්පතු පිළිබඳ සාරාංශ ප්‍රකාශ විගණනය වෙත එවා නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කල් ඉකුත්වූ තැන්පතු පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණි.

## 1.6 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය පරිදි 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම *2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.*

### 1.6.2 අභ්‍යන්තර විගණනය

2012 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

පහත විග්‍රහ කර ඇති පරිදි සමහරක් වත්කම් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක සංඛ්‍යාව | නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| (i) වාහන | 01 | වර්ෂ 2 |
| (ii) පික්අප් රථය | 02 | වර්ෂ 3 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සම්බන්ධයෙන් වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් වාර්තා කරන ලද අතිරික්ත , ඌනතා හා වෙනත් නිර්දේශයන් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) සියළුම ග්‍රාමසේවා නිලධාරි කාර්යාල සම්බන්ධයෙන් 2012 වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා භාණ්ඩ සමීක්ෂණ මුදල් රෙගුලාසි 756 සහ 757 ප්‍රකාරව පවත්වා නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වර්ෂ 1 කට අඩු බේරුම් නොකළ බැරකම් රු. 3,140,590 ක් විය.

## 1.8 අනුකූල නොවීම්

**නීති , රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති , රීති , හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති , රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| මු.රෙ. 110 (1) | 284,838 | සිද්ධීන් කිහිපයකට අදාළ රු. 284,838 ක් වූ පාඩු, පාඩු හා හානි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |
| මු.රෙ. 108 (1) (ඇ) සහ මු.රෙ. 109(1) | 79,647 | (අ) අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු වර්ෂ 25 ට වැඩි වූ හාන කපාහැරීමට කටයුතු කර නොතිබුණි. |
| | 35,242 | (ආ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගෙන් රු. 35,242 ක් වූ පාඩු කපා හැරීමට අනුමැතිය ලබාගෙන තිබුණද මෙම වාර්තාවේ දිනය දක්වා එම පාඩු කපාහැරීමට කටයුතු කර නොතිබුණි. |
| මු.රෙ. 1646 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂය සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික කාර්යසාධන සාරාංශ ඉදිරිපත් කර නොතිබුණි. |

1.9 **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළ යුතු ශේෂ**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයකට අනුව නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස හයක් ඉක්ම වූ චෙක්පත්වල වටිනාකම රු.3,535 ක් විය.

1.10 අවිධිමත් ගනුදෙනු

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මැයි සිට 2012 ජුනි දක්වා හිටපු දිස්ත්‍රික් ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම් නිල නිවස නව දිස්ත්‍රික් ලේකම් වෙත භාරදී නොතිබීමෙන් නව දිස්ත්‍රික් ලේකම්ට මන්නාරම පාර, වව්නියාවේ පිහිටි තාවකාලික වාසස්ථානය භාවිතා කිරීමට සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී තාවකාලික හා භාර නොතිබුණු වාසස්ථාන වෙනුවෙන් රු. 79,708 ක ජල හා විදුලි බිල්පත් දිස්ත්‍රික් ලේකම් විසින් නිරවුල් කර තබුණ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) වෙන්ගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ හින්දු ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කෝවිල් 3 ක "මූලස්ථානම් අත්තිවාරම්" ඉදිකිරීම් සම්බන්ධයෙන් 2012 ඔක්තෝබර් 05 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී එම පර්ක්ෂණ දිනය වනවිටත් වැඩ ආරම්භ නොකර තිබ බවත් 2012 ජුනි 29 දින කොන්ත්‍රාත්කරු වෙත ඇස්තමේන්තු මුදලින් රු. 270,000 ක් හෝ සියයට 72 ක් ගෙවා තිබ බවත් අනාවරණය විය. කෙසේ වුවද 2012 අප්‍රේල් 25 දින කාර්මික නිලධාරී විසින් වැඩ අවසන් කිරීමේ වාර්තා නිකුත් කර තිබුණි.

1:11 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2012 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්තය |
|---|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 13 | 07 | 02 |
| (ii). | තෘතියික මට්ටම | 07 | 05 | 02 | - |
| (iii). | ද්විතීයික මට්ටම | 291 | 171 | 120 | - |
| (iv). | ප්‍රාථමික මට්ටම | 67 | 53 | 14 | - |
| (v). | වෙනත් (අනියම් /තාවකාලික සහ කොන්ත්‍රාත් පදනම) | - | 07 | - | - |
| | එකතුව | 383 | 249 | 143 | 02 |